# ක්‍රියාකාරකම් පත්‍රිකා

# 10 ශ්‍රේණිය
# ඉතිහාසය

## ඒකකය 2
## ශ්‍රී ලංකාව ජනාවාස වීම -03





## මුල් ඓතිහාසික යුගය


අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# මුල් ඓතිහාසික යුගය

1.ඉතිහාසය පෙල පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන සාධකය මින් කුමක්ද?

1. ගම් වැව්වල ව්‍යාප්තිය
2. දාගැබ්වල පිහිටීම
3. රතු - දුඹුරු පස්වල ව්‍යාප්තිය
4. තැනිතලා බිම්වල ව්‍යාප්තිය

02. ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ගංහා නිම්වලින් පිටත ප්‍රදේශවල සිදු වූ බව නූතන පුරා විද්‍යාඥයන්ගේ මතය වී තිබේ. ඒ බව සනාථ කෙරෙන ගංඟා නිම්නයක් වන්නේ කුමක්ද?

1. ගල් ඔය 2. කිරිදි ඔය 3. මල්වතු ඔය 4. යාන් ඔය

03. ලංකා ඉතිහාසයේ පළමුවරට ඔයක් හරහා අමුණක් තැනූ පාලකයා වශයෙන් සැලකෙනුයේ,

1. වසභ රජුය
2. මහසෙන් රජුය
3. පළමුවන අග්බෝ රජුය
4. ඉළනාග රජුය

04. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංහා නිම්නවලින් පිටත, කුඩා වැව් පද්ධති ආශ්‍රිතව ජනාවාස ව්‍යාප්ත වීම ආරම්භ වූවා යැයි සැලකෙනුයේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය.
2. පූර්ව ඓතිහාසික යුගයේදී ය.
3. මුල් ඓතිහාසික යුගයේදී ය.
4. ඓතිහාසික යුගයේදී ය.

05. අනුරාධපුරය නුරුපුර ලෙස හඳුන්වා ඇති ප්‍රසිද්ධ අභිලේඛනය කුමක් ද

1. වල්ලිපුරම් සන්නස
2. පනාකඩුව සන්නස
3. සීගිරි කැටපත් පවුර
4. දෙවනගල ලිපිය

06. පැරණි බ්‍රාග්මීය ලිපිවල පුරකමත යනුවෙන් හඳුන්වා ඇති නිළධාරියා කවුරුන් ද?

1. ප්‍රධාන වාස්තු ශිල්පියා
2. නගර ගුත්තික.
3. මුදල් අයකැමි.
4. දණ්ඩනායක.

● පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

01.

I. සාහිත්‍ය මූලාශ්‍රය වල සඳහන් වාපී ගම්මාන 03 ක් නම් කරන්න

II. පහත සඳහන් වෘත්තිකයන් සෙල්ලිපි වල හඳුන්වා ඇති ආකාරය අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. වඩුවන් විසූ ගම

B. ගොවියන් විසූ ගම

C. මැණික් ගැරූ අය ජීවත් වූ ගම

D. සත්ත්ව පාළනයේ නිරත වූ අය ජීවත් වූ ගම

III. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස සඳහා ප්‍රදේශ තෝරාගැනීමේදී අවධානය යොමු කළ කරුණු හා ඒ සඳහා බලපෑ හේතු කෙටියෙන් විස්තර කරන්න.

IV. මුල් ඓතිහාසික ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කෙටියෙන් විස්තර කරන්න.